12-08-2022 **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පරම පියාගේ උපදේශය වන්නේ ජීවාත්ම අවධානයට පත්වන්න යනුයි. පාරිශුද්ධත්වයට පත්ව අන් සැම කෙනෙක්ම පාරිශුද්ධත්වයට පත් කිරීමට පොළඹවන්න. බුද්ධිය පිළිබඳ විශ්වාසය තබාගෙන පරම පියාගෙන් ඔබගේ සම්පූර්ණ උරුමය හිමිකර ගන්න.

**ප්‍රශ්නය:** අවසානයේදී ශරීරය අත්හැර යන විට, පීඩිතත්ත්වයෙන් හැඬුමට සිදු වන්නේ කාටද?

**පිළිතුර:** ජීව මරණයක් අත්දකින්නේ නැතිව සම්පූර්ණ උත්සාහයෙහි නොයෙදෙන, සම්පූර්ණ උරුමය හිමිකර ගන්නේ නැති අයට අවසානයේදී පීඩිතත්ත්වයෙන් කෑගැසීමට සිදු වෙනවා.

**ප්‍රශ්නය:** මේ කාලයේ මෙහි නොයෙකුත් ආකාරයේ යුද්ධ හා ගැටුම් ඇතිවන්නේත් බෙදීම් ඇතිවන්නේත් මන්ද?

**පිළිතුර:** සැම කෙනෙක්ටම තම නියම පියා අමතක වී ගොස් අනාථයින් බවට පත්ව සිටිනවා. තමා දැඩි සතුටක් ලබාගත් මව හා පියාව ඔවුන් අමතක කර තිබෙනා අතර ඔහු සැම තැනකම සිටිනා බවත් ඔවුන් කියනවා. මේ නිසා තමයි ඒ අය අතර නොයෙකුත් ගැටුම් ඇතිවන්නේ.

**ගීතය:** ශිවා හට අචාර...

ඕම් ශාන්ති. මෙසේ කිව්වේ කවුද? ඕම් ශාන්ති. එසේ කිව්වේ ශරීරයේ ඉන්ද්‍රිය මාර්ගයෙන් ජීවාත්මයයි. ජීවාත්මය අවිනාශී වන අතර ශරීරය විනාශවන සුළු වේ. ජීවාත්මය එක් ශරීරයක් අත්හැර දමා තවත් ශරීරයක් ලබා ගනු ඇත. ජීවාත්මයක් විසින් ගන්නා වැඩිම උපත් සංඛ්‍යාව 84කි. මෙය හඳුන්වන්නේ උපත් 84ක චක්‍රය ලෙසයි. සැම කෙනෙක්ම උපත් 84ක් ගන්නේ නැහැ. මිනිස්සු මේවා ගැන දන්නේ නැහැ. ගීතයේදීඔබ සවන් දුන්නා: ශිවාට අචාර. උසස්ම උසස් වූ තැනැත්තා වන්නේ උත්තරීතර ජීවාත්මය. ශිවාය. ඔහු ජීවාත්ම වන අපද වාසය කරන්නා වූ අශරීරික ලෝකයේ වැසියාය. ඊට පහළින් තිබෙන්නේ සූක්ෂම ලෝකයයි. උසස්ම තැනැත්තා වන්නේ ඔහුයි. ඔබ පරමාත්ම දෙවියන්ගේ ප්‍රශංසනීයත්වය ගැන ඇසුවා: ශිවා හට ආචාර. මව, පියා, මිතුරා හා සහකරුවා වන්නේ ඔබයි. මෙය ඔහුගේ ප්‍රශංසනීයත්වයයි. පසුව ඔවුන් මෙසේද කියනවා: දේව බ්‍රහ්මාට ආචාර. ඔහු නිර්මාණකරුවා වන අතර මේ නිර්මාණයයි. පසුව මෙම මනුෂ්‍ය ලෝකයත් තිබෙනවා. මෙම මනුෂ්‍ය ලෝකයේ දී පමණයි ඔබ පාරිශුද්ධත්වයට පත් වන්නේත් අපිරිසිදු වන්නේත්. සත් යුගයේ දී මිනිසුන් පිරිසිදුයි, කලි යුගයේදී අපිරිසිදුයි. මීට අවුරුදු 5000 කට ප්‍රථම දේවතාවන් මෙහි සිටියා. ඒ සැම කෙනෙක්ම මනුෂ්‍යයන් වූවා. නමුත්, ගුණාංග වලින්ද පිරිපුන් වූවා. කලා දහසයෙන්ම පිරිපුණ් වූවා. මෙය ඔවුන්ගේ ප්‍රශංසනීයත්වයයි. එහි කිසිමාකාරයක සැහැසි බවක් ඇත්තේත් නැහැ. එහිදී ඔවුන් පාපයෙහි ගැලෙන්නේ නැහැ. ඔවුන් සම්පූර්ණයෙන්ම පාපයෙන් තොර වූවන් ලෙස හැඳින්වෙනවා. පාපකාරී මිනිසුන් ඔවුන්ගේ ප්‍රශංසනීයත්වය ගැන ගායනා කරනවා: ඔබ සියලු ගුණාංගයන්ගෙන් පිරිපුණ් වූවන් වන අතර අප පරිහාණියට පත් වූ පාපකාරීන්ය. ඔවුන් දෙවියන් සිහිපත් කරනවා. නමුත් කිසිම කෙනෙක් ඔහු ගැන නොදන්නා නිසා ඔවුන් සැම කෙනෙක්ම අනාථයෙකි. මිනිසුන් මෙසේ ගායනා කරනවා: අප බොහෝ සෙයින් සතුට ලබන්නා වූ මව හා පියා ඔබයි. පසුව, රාවණ්ගේ රාජ්‍යය ආරම්භ වූ විට, සැම මනුෂ්‍යයෙක්ම පරම පියාව අමතක කර දමා අපිරිසිදු අනාථයන් බවට පත් වෙනවා. ඔවුන් දිගින් දිගටම එකිනෙකා හා දබර කර ගනිමින් ඉන්නවා. ඔබ බලනා සැම තැනකම තිබෙන්නේ රණ්ඩු දබර කර ගැනීමම පමණයි. නොයෙකුත් පක්ෂ තිබෙනවා. දිව්‍යලෝකයේ තිබුණේ ලක්ෂ්මී හා නාරායන රාජ්‍යයම පමණයි. භාරතයේ මිනිසුන් තමයි මුළු ලොවෙහිම පාලකයන් වූයේ. දැන්, ඒ සියල්ලම කැබලි වලට වෙන්ව ගොස් තිබෙනවා. එම සාගරය ඔබගේයි. මෙය අපගේයි. පන්ජාබය, උත්තර ප්‍රදේශය, රාජස්ථානය ආදී සියල්ල දැන් බෙදී ගොස් තිබෙනවා. භාෂාව පිළිබඳව පවා නොයෙකුත් ගැටුම් ඇති වෙනවා. මන්ද, ඔවුන් මෙලොවින් ඔබ්බෙහි සිටින්නා වූ මව හා පියා ගැන නොදන්නා නිසයි. භාරතය දිව්‍යලෝකයක්ව තිබෙනා කල, මේ කිසිම දෙයක් ස්ථාපිත වී තිබුණේ නැහැ. එය දැන් නැවතත් දිව්‍යලෝකය බවට පත් වීමටයි යන්නේ. පරම පියා මෙහි අසුන්ගෙන මෙම ලෝක චක්‍රය කැරකෙන්නේ කෙසේද යන්න ගැන විස්තර කරනවා. අසීමිත වූ පියා දරුවන් වනඔබට කියනවා: ඔබ බොහෝ අසිහියට පත් වී තිබෙනවා. ඔබ කියනවා: අහෝ උත්තරීතර පියාණනි, උත්තරීතර ජීවාත්මය. ඒ වගේම ඔබ ඔහුගේ ජීවිත කතාව ගැන දන්නේත් නැහැ. පාරිශුද්ධකරුවා, විමුක්තිදායකයා වන්නේ පරම

පියායි. ඒ මිනිස්සු දෙවියන් සෑම තැනකම සිටිනා බව පවසන බව ඔබ දන්නවා. ඔහු සෑම තැනකම ඉන්නවා යැයි කීමෙන් ඔබට උරුමයක් ලද හැක්කේ කෙසේද? උරුමයක් දිය හැකි පරම පියාණන් අනිවාර්යෙන්ම අවශ්‍ය වෙනවා. ඔබගේ භෞතික පියා කවුද කියා ඔබ දරුවකුගෙන් විමසුවහොත් ඔහු සෑම තැනකම ඉන්නවා කියා ඔවුන් කියයිද? නිර්මාණකරුවා වන්නේ ඒ අසීමිත වූ පියායි. සෑම භක්තිකයෙක්ම ඔහුට කන්නලව් කරනවා: අහෝ පාරිශුද්ධකරුවාණනි, ශිව බාබා, අපිරිසිදු වූ අපව පාරිශුද්ධත්වයට පත් කරන්න. පැමිණ නැවතත් වතාවක් දිව්‍යලෝකයේ මනුෂ්‍යයන් වැනිම වූ පාරිශුද්ධත්වයට අපව පත් කරන්න. අප ඉන්නේ ඉතාමත් අසතුටිනි. රාවණ්ගේ රාජ්‍යය ඇරඹුණු තැන් සිට, සෑම මනුෂ්‍යයෙක්ම අපිරිසිදුභාවයට පත් වීමට පටන් ගන්නවා. ඔවුන් දිගින් දිගටම දොරක් දොරක් පාසා රස්තියාදුවේ යමින් ඉන්නවා. දෙවියන් සෑම කෙනෙක්ම තුළ සිටිනවා කියා ඔවුන් විශ්වාස කරනවා. ඔවුන් ළඟ ගලින් නෙළූ පිළිම තිබෙනා අතර ඔවුන් සිතනවා දෙවියන් ඒවායෙහිත් ඉන්නවා කියා. ඔහෝ,නමුත් දෙවියන් කොහොමද ගලක් තුළ වාසය කරන්නේ? ඔහු වාසය කරන්නේ ඒ උත්තරීතර දනව්වේයි. ඔවුන් නොයෙකුත් පිළිරූ තනන අතර එම ප්‍රතිමා පැරණි වූ විට, ඒවා විසිකර දමනවා. එය තමයි බෝනික්කන්ට වන්දනා කිරීම ලෙස හඳුන්වන්නේ. ඔවුන් කියනවා: බාබා, අපට විමුක්තිය ලබා දෙන්න. සියල්ලන්ටම විමුක්තිය ලබා දෙන්නා වන්නේ ඒ එකම එක පාරිශුද්ධකරුවා, ශිව බාබා ම පමණයි. සෑම මනුෂ්‍යයෙක්ම ඇත්තෙන්ම දෙවියන් යනු කවුද යන්න ගැන අමතක කර දමා තිබෙනවා. තවමත් සෑම කෙනෙක්ම ඔහුව සිහිපත් කරනවා. සියලු ස්වාමිපුරුෂයන්ගේ ස්වාමිපුරුෂයා වන්නේත් සියලු පියවරුන්ගේත් පියා වන්නේත් ඔහුයි. පරම පියා කියනවා: දරුවනි, දැන් පාරිශුද්ධත්වයට පත්වන්න. ජීවාත්ම වන ඔබ දැන් අපිරිසිදුභාවයට පත්ව සිටිනවා: ඔබ මත මළකඩ බැඳී තිබෙනවා. නියම රත්රන් වලට මළකඩ මිශ්‍ර කිරීමෙන්, රත්රන් වල වටිනාකම අඩු වෙනවා. ඉතින්, මෙයද තමෝප්‍රධාන් ලෝකයක් වෙනවා. පළමුවෙන්ම ඔබ සත් යුගයේ සිටිනා කල ඔබ සම්පූර්ණයෙන්ම පාපයෙන් තොර වූවා. පසුව ඊට රිදී, මළකඩ මිශ්‍ර වූවා. පසුව තඹත් මිශ්‍ර වූ අතර අන්තිමේදී යකඩත් මිශ්‍ර වූවා. ජීවාත්මය දිගින් දිගටම අපිරිසිදුභාවයට පත් වනවා. එය දැන් සම්පූර්ණ කලි යුගී තත්ත්වයට පත්ව තිබෙනවා. ඒ සතෝප්‍රධාන් තත්ත්වයේ තිබ් භාරතයම තමෝප්‍රධාන්භාවයට පත්ව තිබෙනවා. මුලදී සිටි අය තමයි අනිවාර්යෙන්ම උපත් 84ක් ලබාගත යුතු වන්නේ. ක්‍රිස්තියාණිත් එන්නේ ප්‍රමාද වෙලයි. ඔවුන්ට උපත් 84ක් ගත නොහැකියි. වැඩිම වශයෙන් ඔවුන් ගන්නේ උපත් 35ක් හෝ 40ක් පමණයි. ලොව පවතින කාලපරිච්ඡේදය දැන් අවසන් වෙමින් තිබෙනා අතර නැවතත් එය අළුත් වෙනවා. නව ලෝකයේ සතුට තිබෙනා අතර පැරණි ලෝකයේ තිබෙන්නේ දුකයි. සාමාන්‍යයෙන් පැරණි ගොඩනැඟිලි විනාශ කර දැමෙනවා. පැරණි ලෝකයේ සිටිනා සියල්ලන්ම දැන් ඉන්නේ අසතුටින්. සෑම කෙනෙක්වම සතුටට පත් කරවන්නේ ඒ එකම එක පියා පමණයි. සත් යුගයේ සෑම ජීවාත්මයක්ම සතුටින් සිටියා. අනෙක් සියලුම ජීවාත්ම සිටින්නේ සාම දේශයේයි. එය හඳුන්වන්නේ නිහඬත්වයෙන් පිරි ලෝකය ලෙසයි. එහි නිහඬත්වයේ ලෝකයත් පසුව සූක්ෂම ලෝකයත් තිබෙනවා. එහි කිසිම ශරීරයක් ඇත්තේ නැහැ. ඉතින් ජීවාත්මයක් විසින් යම් ශබ්දයක් නගන්නේ කෙසේද? දැන් සෑම ජීවාත්මයක්ම තමෝප්‍රධාන් වන අතර මේ නිසා තමයි මෙය කලි යුගය ලෙස හැඳින්වෙන්නේ. මුලදී ඔබ සත්යුගයේ සිටි අතර පසුව පරම පියා දැන් නැවතත් ඔබව සත්යුගය වෙත රැගෙන යාම සඳහා පැමිණ සිටිනවා. ඔහු සාමාන්‍ය මනුෂ්‍යයින්ව දේවතාවන් බවට පත් කරවනවා. ස්වර්ණමය යුගයේ දී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම පාරිශුද්ධත්වය රකිනවා. එය හඳුන්වන්නේ රාමාගේ රාජ්‍යය ලෙසයි. මේ රාවණ්ගේ රාජ්‍යයයි. ඔවුන් දිගින් දිගටම එකිනෙකා වෙත රාගය නම් වූ කඩුව පාවිච්චි කරනා අතර දිගින් දිගටම එකිනෙකාව අසන්තෝෂයට පත් කරනවා. පරමාත්ම දෙවියන් කියන්නේ: දරුවනි, රාගය ඔබගේ ලොකුම සතුරායි. මෙමඟින් තමයි ඔබව අසන්තෝෂයට පත් කර තිබෙන්නේ. දරුවන් දිගින් දිගටම පහළට බසිමින් පැමිණ සිටිනවා. දැන් ඔබ ළඟ කිසිම කලාවක් ඉතිරි වී නැහැ. පරම පියා දැන් නැවතත් ඔබව කලා දහසයෙන්ම පිරිපුණ් අය බවට පත් කිරීම උදෙසා පැමිණ සිටිනවා. මෙහිදී, ඔබ සන්‍යාසීන් මෙන් නිවස, ඔබගේ පවුල ආදී කිසිවක් අත්හැර දමා යා යුතු වන්නේ නැහැ. ඒ නිර්මල වූලෝකය වෙත යාම උදෙසා මේ අවසන් උපතේදී ඔබ අනිවාර්යෙන්ම පාරිශුද්ධත්වයට පත් විය යුතු වෙනවා. පරම පියා මාර්ගයෙන් පිරිශුද්ධත්වයට පත් වන අය ඒ නිර්මල ලොවෙහි පාලකයන් බවට පත් වෙනවා. දරුවන් ඔබගේ පියා ළඟට පැමිණ සිටිනවා. සෑම දෙනාම පැමිණෙන්නා වූ ප්‍රධාන මධ්‍යස්ථානය වන්නේ මෙයයි. මෙලොවින් ඔබ්බෙහි සිටින්නා වූ පියා ජීවාත්ම වන ඔබට මෙසේ පවසනවා: දරුවනි, දැන් ජීවාත්ම අවධානයට පත්වන්න. ජීවාත්ම මෙසේද කියනවා: ඔව්, බාබා අපි අනිවාර්යෙන්ම ඔබගේ අණට කීකරු වන්නෙමු. අපි පාරිශුද්ධත්වයට පත්වන්නෙමු. ශ්‍රීමත් ලෙස හඳුන්වන්නේ මෙයයි. ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් පමණයි ඔබට උසස් භාවයට පත් විය හැක්කේ. රාවණ්ගේ උපදෙස් අනුගමනය කිරීමෙන් ඔබ දූෂිතත්ත්වයට පත්ව තිබෙනවා. එමනිසා,

ජීවාත්මය මෙම ශරීරය මාර්ගයෙන් මෙසේ කියනවා: ඔහෝ බාබා, මා දැන් අයිති වන්නේ ඔබටයි. පරම පියා කියනවා: මා ඔබ සෑම දෙනෙකුටම විමුක්තිය ලබා දීම උදෙසා, පාපකාරී ජීවාත්ම මඟින් පුණ්‍ය ජීවාත්ම බවට පත් කිරීම උදෙසා පැමිණ සිටිනවා. එමනිසා, ඔබ අනිවාර්යෙන්ම පාරිශුද්ධත්වයට පත් විය යුතුයි. පළමුවෙන්ම ඔබ පාරිශුද්ධත්වයට පත් වී බ්‍රහ්ම කුමරුන් හා කුමරියන් බවට පත් වූවායින් පසුව පමණයි, ශිව බාබාගෙන් දිව්‍යලෝකයේ සතුට නම් වූ උරුමය හිමිකර ගත හැකි වන්නේ. ඔබ දැන් නැවතත් පරම පියාගෙන් ඔබගේ උරුමය හිමිකර ගැනීම උදෙසා පැමිණ සිටිනවා. ඔබ දේවතා ධර්මයට අයත් වූඅතර උපත් 84ක්ද ලබාගෙන තිබෙනවා. ඒ දේවතාවන් දැන් මෙහි ඇත්තේ නැහැ. අපිරිසිඳුභාවයට පත් වූ දේවතාවන් දැන් පැමිණ පාරිශුද්ධත්වයට පත්වෙනවා. ප්‍රමාද වී එන අයට දිව්‍යලෝකය වෙත යා නොහැකියි. උපත් 84ක් ලබා ගත් දේවතා ධර්මයේ අය දැන් නැවතත් වතාවක් දේවතාවන් බවට පත් වීමටයි යන්නේ. බාබා කියනවා: මා පැමිණ බ්‍රහ්මා මාර්ගයෙන් ඔබව දේවත්වයට පත් කරවනවා. පාරිශුද්ධත්වයට පත් වීමෙන් තොරව ඔබට දේවත්වයට පත් විය නොහැකියි. මෙහි පැමිණ බ්‍රහ්ම කුමරුන් හා කුමරියන් බවට පත් වන අය පමණයි මෙම කරුණු වටහා ගන්නේ. ප්‍රජාපිතා (මනුෂ්‍යත්වයේ පියා) මෙහිදී සිහිපත් වෙනවා. මනුෂ්‍ය ලෝකයේ ජගත් මාතාව හා ජගත් පිතා ඉන්නවා. ඔවුන්ට දරුවන් බොහොමයක් සිටිය හැක්කේ කෙසේද? ඔබ දැන් බ්‍රහ්මාගේ මුඛයෙන් උපන් නිර්මාණය වෙනවා. ඔබ සෑම කෙනෙක්ම මෙසේ කියනවා: මමා, බාබා, ඔබ දරුවන් බවට පත් වූයේ කෙසේද? ශිව බාබා බ්‍රහ්මා මාර්ගයෙන් ඔබව තමා වෙත අයිති කර ගත්තා. ඔබ ශිව බාබාගෙන් දිව්‍යලෝකයේ උරුමය හිමිකර ගැනීම උදෙසා ශිව බාබාව සිහිපත් කරනවා. එමනිසා, සෑම බ්‍රහ්ම කුමරෙක්මත් කුමරියක්මත් සහෝදර සහෝදරියන් වේ. මෙය උපක්‍රමයකි. බාබා කියනවා: ඔබට ඔබගේ පවුලේ අයත් සමඟ ජීවත් විය හැකියි. නමුත්, නෙළුම් මලක් සේ පාරිශුද්ධත්වයට පත් වන්න. මෙය ක්‍රියාවෙන් පෙන්නුම් කරන්න. ඔබගේ නිවස හෝ පවුලේ අය අත්හැර යාමට මෙහිදී අවශ්‍යතාවයක් එන්නේ නැහැ. ඔබගේ නිර්මාණය හොඳින් රැක බලා ගන්න. ඉතා සරළ ලෙස පාරිශුද්ධත්වයෙන් යුතුව ජීවත් වන්න. එවිට ඔබ නැවතත් වතාවක් මේ දේවතාවන් වැනි තත්ත්වයට පත් වෙනවා. දේවතා ධර්මයේ ස්ථාපනය නැවතත් වතාවක් සිදුවිය යුතුමයි. පරම පියා මෙහි අසුන්ගෙන පෞද්ගලිකවම දරුවන් වන ඔබට විස්තර කර දෙනවා. මේ මධුබනය තමයි ප්‍රධාන කාර්යාලය වන්නේ. දිගින් දිගටම නොයෙකුත් මධ්‍යස්ථාන විවෘත වෙනවා. මීට ඉහත කල්පයේදී බ්‍රහ්ම කුමරුන් හා කුමරියන් බවට පත් වූ අය බ්‍රහ්මිණ් බවට පත් වී, පසුව දේවත්වයටත්, වෛශ්‍ය, ක්ෂත්‍රිය හා ශුද්‍ර යන තත්ත්වයන්ටත් පත් වෙනවා. ඔබ දැන් බ්‍රහමින්වරුන් බවට පත් විය යුතුයි. බ්‍රහමින්වරුන්ගේ මුදුන් කොණ්ඩයක් තිබෙනවා. ඔබ අනිවාර්යෙන්ම මෙම වංශ සියල්ල පසුකර යා යුතුයි. පරම පියා කියනවා: ඔබ දේවතාවන්ව සිටියා. ඔබ දැන් ශුද්‍ර තත්ත්වයෙන් නැවතත් වතාවක් දේවත්වයට පත් වීම උදෙසා බ්‍රහ්මිණ්වරුන් බවට පත්ව සිටිනවා. ඔබ පාරිශුද්ධත්වයට පත් වෙනවා. කතාවක් තිබෙනවා: කුමාරි කෙනෙක් යනු පරම්පරා 21ක් අභිවෘද්ධියට ලක් කරන්නෙක් බව. ඔබ සෑම කෙනෙක්ම බ්‍රහ්ම කුමරුන් හා කුමරියන් වේ. කුමරුන් හා කුමරියන් දෙගොල්ලන්ම ඉන්නවා. ඔබ සෑම කෙනෙකුටම පරම්පරා 21ක් සඳහා වූ නිරන්තර සතුට සඳහා වූ මාර්ගය පෙන්වා දෙනවා. අපගේ සතුටේ දේශය වෙත පැමිණෙන්න. මෙය දුකින් පිරි දේශයයි. ඔබ දැන් පරම පියා සිහිපත් කළ යුතුයි. පරම පියා කියනවා: පාරිශුද්ධත්වයට පත් වී නිරන්තරයෙන්ම මා පමණක් සිහිපත් කරන්න. වෙන කිසිම මනුෂ්‍ය ශරීරයක් සිහිපත් කරන්න එපා. පරම පියා මෙහි අසුන්ගෙන දරුවන් වනඔබව දැඩි සතුටට පත් කරනවා. දැන් ඔබට මෙහි සෑහෙන දුකක් දැක ගන්නට පුළුවන්. දුකෙහිදී පමණයි මිනිස්සු දෙවියන් සිහිපත් කරන්නේ. පරම පියා විසින් ඔබව දිව්‍යලෝකය වෙත ගෙන යැවෙනවා. ඉතින් ඔබ එහිදී ඔහුව සිහි කරන්නේ ඇයි? ඔවුන් කියනවා: අහෝ දෙවියනි, ඔහෝ අන්ධයා හට බස්තමක් වූ පියාණනි, ආදී වශයෙන්. කොහොමනමුත්,ඔවුන් කිසිම දෙයක් දන්නේ නැහැ. ඔවුන් ලක්ෂ්මි හා නාරායන ඉදිරියට පවා ගොස් මෙසේ කියනවා: මව හා පියා ඔබයි. නමුත් දිව්‍යලෝකයේ පාලකයන් ඔවුන් වේ. ඔහු සෑම කෙනෙකුගේම මව හා පියා විය නොහැකියි. ක්‍රිෂ්ණා එක් රාජ්‍යයකිනි, රාධේ තවත් රාජ්‍යයකිනි. පසුව ඔවුන් අතර විවාහ යෝජනාවක් ඇති වෙනවා. ඔවුන්ගේ විවාහයෙන් පසු ඔවුන්ගේ නම් වෙනස් වෙනවා. ලක්ෂ්මි හා නාරායන විෂ්ණුගේ ද්විත්ව ස්වරූපය වෙනවා. දීපමාලාහිදී (ආලෝක උත්සවය), ඔවුන් මහාලක්ෂ්මිට ආරාධනා කරනවා. එය ජෝඩුවක ස්වරූපයක් ගන්නකි. ඔබ දැන් රාගය නම් වූ ගින්නෙන් එපිටට පැමිණ ඥානය නම් වූ ගින්න මත අසුන් ගන්නවා. නියම බ්‍රහ්මිණ්වරුන් වන්නේ ඔබයි. ඔබ ඔවුන්ව පාරිශුද්ධත්වයේ පොරොන්දුවක් දීමට පොළඹවනවා. ඒ අසීමිත වූ පියා කියනවා: පාරිශුද්ධත්වයට පත් වන්න. එවිට ඔබට ඒ නිර්මල ලෝකයේ පාලකයන් බවට පත් වීමට හැකි වනු ඇත. ගෙදර සිටිනා විටත් ඔබට ඔහුව සිහිපත් කරන්න පුළුවන්. බාබා කියනවා: ඔබ සෑම කෙනෙක්ම නිවස වෙත,මා වෙත පැමිණිය යුතුයි. සෑම කෙනෙක්ම මිය යා යුතුයි. මේ එම මහාභාරත යුද්ධයමයි. යාවනාවරුන් සමඟත් යුද්ධයක් තිබෙනවා.

ස්වර්ණමය යුගයේ යුද්ධ ආදී වූ කිසිවක් ඇත්තේ නැහැ. පරම පියා කියනවා: ඔබ මේ රාවණ්ව පරාජය කර දැමිය යුතුමයි. වෙන කිසිම යුද්ධයක් පිළිබඳව මෙහි ප්‍රශ්නයක් ඇත්තේ නැහැ. මහාභාරත යුද්ධයත් සිදුවන අතර ඉතාමත් ටික දෙනෙක් පමණයි ඉතිරි වන්නේ. අවිනාශී වූදේශය වන්නේ භාරතයයි. අනෙක් සියලුම දේශ විනාශ වී යනවා. පරම පියා සෑම කෙනෙක්වම නැවතත් නිවස වෙත ගෙන යනවා. පරම පියා සෑම කෙනෙකුටම විමුක්තිය ලබා දෙනවා. ඔහු සෑම ජීවාත්මයක්ම ඔහුත් සමඟ නිවස වෙත ගෙන යනවා. ඔබ දැන් පරම පියාගෙන් ඔබගේ උරුමය හිමිකර ගන්නවා. සන්‍යාසීන්ට මෙය ලබා දෙන්න බැහැ. ඔවුන් දිව්‍යලෝකයේ නිර්මාණකරුවන් නොවේ. දිව්‍යලෝකය දැන් ස්ථාපනය වෙමින් පවතිනවා. අපායේ සෑම මනුෂ්‍යයෙක්ම දැන් විනාශයට පත් වීමටයි ඉන්නේ. සෑම කෙනෙක්ම මිය යා යුතුයි. ඉතින් ඔබ මේ ජීවත්ව සිටිනා අතරම ඔබගේ උරුමය ලබා නොගන්නේ ඇයි? එසේ නැතිනම්, ඔබට පීඩිතත්ත්වයෙන් කෑ ගැසීමට සිදු වෙනවා. අවසානයේ දී සියලු මනුෂ්‍යයන් කුම්භකරණ නම් වූ අපිරිසිදු නින්දෙන් අවදි වනවා. ඔබ බුද්ධිය තුළ මේ සම්පූර්ණ ඥානය අන්තර්ගත වෙනවා. ඔබ වන්දනීයත්වයට සුදුස්සන් වූ අතර දැන් වන්දනාකරුවන් බවට පත් වී නැවතත් වතාවක් වන්දනා ලබන්නන් බවට පත් වෙනවා. එහි පිරිසිදු රජවරුන් මෙන්ම අපිරිසිදු රජවරුනුත් සිටියා. දැන් මෙහි කිසිම රජ කෙනෙක් ඇත්තේ නැහැ. දැන් මිනිස්සු විසින්ම ආණ්ඩුව පාලනය වනවා. ලෝකය දැන් නැවතත් චක්‍රය වටාම ගමන් කළ යුතුයි. ඔබ ස්වර්ණමය යුගය වෙත යා යුතුමයි. ශිව බාබා මොහුගේ මුඛය මාර්ගයෙන් මෙසේ කියනවා: ඔබ මගේ දරුවන්. ඒ වගේම ඔබත් කියනවා: බාබා අප ඔබගේ දරුවන්. බ්‍රහ්මාගේ මුඛයෙන් උපන් නිර්මාණය ඔබයි. ඔබ දේව පවුලක්. පරමාත්ම දෙවියන් කතා කරයි: එකම එක පියා පමණක් සිහිපත් කරන්න. අප සෑම කෙනෙක්ම බාබා වාසය කරන්නා වූ අපගේ ඒ සුමිහිරි නිවහන වෙත යනවා. පසුව බාබා අපව ඒ සුමිහිරි වූ දිව්‍යලෝකය වෙත යවනවා. එහි සාමය හා සතුට තිබෙනවා. ඔබ මෙහි පැමිණ සිටින්නේ, පාරිශුද්ධත්වය, සතුට හා සාමයේ ඔබගේ උරුමය හිමිකර ගැනීමටයි. මෙම අධ්‍යාපනය තිබෙන්නේ උපත් 21ක් සඳහායි. ඔබ මේ ඉගෙන ගන්නේ මේ ලෝකයේ සැපත සඳහා නොවේ. මෙය මරණයේ දේශයයි. ඔබ ඒ අමරණීයත්වයේ ස්වාමියාගෙන් අමරණීයත්වයේ කතන්දරය අසා අමරණීයත්වයට පත් වෙනවා. මෙහි පැමිණ පරම පියා ගැන වටහා ගන්නා අය පාරිශුද්ධත්වය රැකීම උදෙසා පොරොන්දුවක් වෙනවා. පසුව ඔවුන් පැමිණ තම උරුමය හිමිකර ගන්නවා. බොහෝ දෙනා දිගින් දිගටම බ්‍රහ්ම කුමරුන් හා කුමරියන් බවට පත් වෙනවා. දිනෙන් දින මධ්‍යස්ථාන ගණනාවක් බිහිවෙනවා. ශුද්‍රයින් දිගින් දිගටම බ්‍රහ්මිණ්වරුන් බවට පත් වනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වූණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරම පියාගෙන් ඔබගේ දිව්‍යලෝක උරුමය හිමිකර ගැනීම උදෙසා, තම පවුලේ අයත් සමඟ එකට ජීවත්ව සිටිනා අතර, ඔබගේ දරුවන්ද රැකබලා ගනිමින් නෙළුම් මලක් සේ පාරිශුද්ධත්වයෙන් යුතුව ජීවත් වන්න.
2. සෑම කෙනෙකුටම පරම්පරා 21ක් පුරා සතුටින් සිටීමෙහි මාර්ගය පෙන්වා දෙන්න. ඥානය නම් වූගින්න මත අසුන්ගෙන ශුද්‍ර තත්ත්වයෙන් බ්‍රහ්මිණ් බවට පත් වී දේවත්වයට ද පත් වන්න.

**වරදානය:** ඔබ මාස්ටර් සහ සාගරයක් වීම මඟින් ඥානාන්විත වී ඕනෑම පිළිකුල් සහගත හැඟීම් අවසන් කරත්වා.

ඥානයෙන් සපිරි දරුවන් එනම්, ඥානාන්විත දරුවන්, සියල්ලන් වෙනුවෙන් මාස්ටර් ස්නේහ සාගර වෙති. ඔවුන්ට සෙනෙහස හැර අන් දෙයක් නොමැත. මෙකල, භෞතික ධනයට වඩා සෙනෙහස උදෙසා විශාල අවශ්‍යතාවයක් තිබේ. එමනිසා, මාස්ටර් ස්නේහ සාගරයක් වී, ඔබට අවමන් කළ අයව නංවාලන, හුදෙක් පරම පියාට සියලු දරුවන් කෙරෙහි කරුණාව සහ පරිත්‍යාගශීලී හැඟීම් තිබෙන්නාක් සේ, එලෙසින්ම, පියා මෙන් කරුණාබරිත හා සමාව දීමේ සාගර වන ඔය දරුවන් තුළ කිසිවෙකු කෙරෙහිත් පිළිකුල් හැඟීම් තිබිය නොහැක.

**පාඨය:** සියලු සීමිතයන් අවසන් කර අසීමිත දැක්ම ඇති කර ගැනීම එකමුතුකමේ පදනම වේ.

*** ඕම ශාන්ති ***